JMC vLearning
"your virtual learning partner"

# එකතු කළ අගය මත බදු
# VAT

## AAT අදියර III
## CPT - සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය

නුවන් සමීර
B.Sc. (Accountancy) Sp., CBA, ACCA Finalist

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

පරිච්ඡේදය 9

# එකතු කළ අගය මත බදු
# (Value Added Tax – VAT)

ශ්‍රී ලංකාවේ ප්‍රධානතම වක්‍ර බදු වර්ගය මෙය වේ. මෙය අවසාන පාරිභෝගිකයා මත අය කරනු ලබන බද්දකි.

2002 අංක 24 දරණ එකතු කළ අගය මත බදු පනතින් 2002 අගෝස්තු 02 වන දින සිට එකතු කල අගය මත බදු හඳුන්වා දී ඇත.

එකතු කල අගය මත බදු පනත දෙයාකාරයකට වර්ග කළ හැකිය.

A. මූල්‍ය සේවා නොවන සැපයුම් මත බදු බැඳයාව

B. මූල්‍ය සේවා මත වූ බදු බැඳියාව

## A. මූල්‍ය සේවා නොවන සැපයුම් මත එකතු කළ අගය බත බද්ද

මෙම මාතෘකාව යටතේ,

1. ලියාපදිංචි වීමේ අවශ්‍යතාවය
2. බදු අයකළ හැකි ක්‍රියාකාරකම්
3. බදු අයකළ හැකි සැපයුම
4. භාණ්ඩ හා සේවා සැපයුම
5. බදු අයකළ හැකි කාලපරිච්ඡේදය
6. සැපයුමේ වේලාව හඳුනා ගැනීම
7. මුදල් පදනම
8. බද්දෙන් බැහැර කෙරෙන සැපයුම
9. නිදහස් සැපයුම
10. ලියාපදිංචි සහතිකය
11. ලියාපදිංචිය අවලංගු කිරීම
12. බදු අනුපාත
13. බද්ද ගණනය කිරීම
14. යෙදවුම් බද්දට හිලව් කිරීම
15. සරල කල එකතු කළ අගය මත බද්ද
16. බදු ඉන්වොයිසිය
17. බදු වාර්තා සැපයීම
18. ආපසු ගෙවීම්

JMC vLearning "your virtual learning partner"

# 1. ලියාපදිංචිය

## 1.1 එකතු කල අගය සඳහා ලියාපදිංචි විය යුතු පුද්ගලයන්

(i) භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් (ආයතනකරුවන් ඇතුලත්ව) වෙළඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රැකියාවක් පවත්වා ගෙන යනු ලබන ඕනෑම තැනැත්තෙකුගේ බද්දට යටත් භාණ්ඩ හා සේවාවල වටිනාකම කාර්තුවකට **<u>රු. මිලියන 75</u>** ක් හෝ වර්ෂයකට **<u>රු. මිලියන 300</u>** ඉක්මවයි නම්, එකතු කල අගය සඳහා ලියාපදිංචි විය යුතුය.

- ඉහතින් සඳහන් කරන ලද වාර්ෂික හෝ කාර්තු සැපයුම් / පිරිවැටුම් සීමාව ගණනය කිරීමේදී බද්දෙන් නිදහස් සැපයුම් තිබේනම් ඉවත් කල යුතුය.
- සියළුම ආනයනකරුවන් VAT සඳහා ලියාපදිංචි විය යුතු අතර ඉහත සැපයුම් සීමාවට අඩු වන්නේ නම් තාවකාලික ලියාපදිංචියක් ලබාගත යුතුය.

(ii) තොග හා සිල්ලට වෙළඳ කටයුතු / ක්‍රියාකාරකම්

- 2016 නොවැම්බර් 01 සිට 2020/01/01 දක්වා සීමාව කාර්තුවකට රු. මිලියන 12.5 කි.
- 2020 ජනවාරි 01 සිට කාර්තුවක සැපයුම් සීමාව රු. මිලියන 75 ඉක්මවන්නේ නම් ලියාපදිංචි විය යුතුය.

## 1.2 ලියාපදිංචිය සිදුවන හැකි ආකාර

1. අනිවාර්ය ලියාපදිංචිය
2. බලහත්කාරයෙන් ලියාපංදිචිය
3. ස්වේච්ඡා ලියාපදිංචිය

## 1.3 එකතු කල අගය මත බදු වගකීම (2 වන වගන්තිය)

පනතේ විධිවිධානයන්ට යටත්ව, සැපයුමක් කරන පහත අවස්ථාවන්හිදී එම සැපයුම්වල වටිනාකම මත බදු අය කල යුතුය.

1. **<u>ලියාපදිංචි තැනැත්තෙකු</u>** විසින් ශ්‍රී ලංකාව තුල **<u>බදු අය කළ හැකි ක්‍රියාකාරකරමක්</u>** කරගෙන යාමේදී හෝ කිරීමේදී, බදු අය කළ හැකි කාලසීමාවක් තුල ඔහු විසින් කරනු ලබයි. සෑම **<u>බදු අය කළ හැකි භාණ්ඩ හා සේවා සැපයුමක්</u>** මත එම සැපයුම කරන අවස්ථාවේදීම.
2. ඕනෑම තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාවට භාණ්ඩ ආනයනය කිරීමේදී.

   ඒ අනුව එකතු කල අගය මත බද්දට යටත් වීමට පනතේ 2 වන වගන්තිය යටතේ පහත කරුණු සම්පූර්ණ විය යුතුය.

   (i) ශ්‍රී ලංකාව තුල බදු අය කළ හැකි ක්‍රියාකාරකමකින් භාණ්ඩ හා සේවා සැපයීම.
   (ii) ශ්‍රී ලංකාව තුල බදු අයකළ හැකි ක්‍රියාකාරකම පවත්වාගෙන යාම.
   (iii) ලියාපදිංචි තැනැත්තෙකු විසින් සැපයුම සිදු කිරීම.
   (iv) ශ්‍රී ලංකාවට භාණ්ඩ ආනයනය.

JMC vLearning "your virtual learning partner"

- ආනයන සම්බන්ධව ගත් විට එය ලියාපදිංචි පුද්ගලයෙකු විසින් සිදු කිරීම අවශ්‍යම නොවන කරුණකි.
- ව්‍යාතිරික්ත හෝ නිදහස් නොවන ඕනෑම භාණ්ඩයක් ආනයනය කරන අවස්ථාවේදී එකතු කළ අගය මත බද්දට යටත් වේ.

## 1.4 බදු අය කළ හැකි සැපයුම

බදු අය කළ හැකි වූද, ශ්‍රී ලංකාවේදී සලකනු ලැබුවා වූ බදු නිදහස් සැපයුමක් හැර, ශුන්‍ය අනුපාතයට අය කරන ලද සැපයුමක් ද ඇතුලත්ව යම් භාණ්ඩ හා සේවා සැපයුමක් අදහස් වේ.

## 1.5 බදු අය කළ හැකි කාලසීමාව (Taxable Period)

(a) පහත අවස්ථාවලදී බදු අය කළ හැකි සීමාව **මාසයක** කාලයක් වේ.

- යම් තැනැත්තෙකු ශුන්‍ය අනුපාතය යටතේ සැපයුම් (අපනයන) කරන අවස්ථාවලදී
- යම් තැනැත්තෙකු විසින් ව්‍යාපාරයක් හෝ ව්‍යාපෘතියක් ආරම්භ කොට එකතු කල අගය මත බදු පනතේ 22(7) වගන්තියේ නියමයන්ට අනුකූල වීමට භාරගත් අවස්ථාවක (මේ යටතේ බදු අයවන සැපයුම් කිරීමට දිගු කාලයක් ගතවන ව්‍යාපාර සහ ව්‍යාපෘතීන් සැලකිල්ලට ගැනේ)
- රෙදිපිලි පංගු මණ්ඩලයේ (TQB) හෝ අපයන සංවර්ධන මණ්ඩලයෙහි (EDB) ලියාපදිංචි යම් තැනැත්තෙක් රෙදිපිළි පංගු මණ්ඩලයෙහි (TQB) හෝ අපනයන සංවර්ධන මණ්ඩලයෙහි (EDB) ලියාපදිංචිගත අපනයනකරුවෙකුට සැපයුම් කරුනු ලබන අවස්ථාවකදී.

(b) ඉහත (a) යටතට නොගැනෙන තැනැත්තෙකු හෝ කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය මත **කාර්තුමය** වාර්තා ඉදිරිපත් කිරීමට එකඟ වන්නා වූ තැනැත්තෙකු සම්බන්ධව වන විට, **මාස තුන (03)** ක අදහස් වේ. එම කාර්තු වර්ෂයේ පහත දිනයන් වලින් ආරම්භ වේ.

| | |
|---|---|
| ජනවාරි | 01 |
| අප්‍රෙල් | 01 |
| ජුලි | 01 |
| ඔක්තොම්බර් | 01 |

### භාණ්ඩ සැපයීම

භාණ්ඩවල සම්පූණ අයිතිය මාරු කිරීම ලිඛිත නීතියේ අධිකාරිය බලය මත සිදු වීමයි. ප්‍රසිද්ධ වෙන්දේසියකදී කුලී සින්නක්කර ක්‍රමය යටතේ සහ ණය බැරක් පියවීමේ කාර්යය සඳහා යන අවස්ථාවල භාණ්ඩ ක්‍රියාකාරකමකින්, බදු අය නොවන ක්‍රියාකාරකමකට භාණ්ඩ මාරු කිරීමක් ද අයත් වේ.

JMCvLearning "your virtual learning partner"

**සේවා සැපයීම**

භාණ්ඩ සැපයුමක් නොවන වෙනත් සැපයුම් මෙයට අයත් වේ.

**සැපයුම සිදු කරන වේලාව (Time of Supply)**

ලියාපදිංචි තැනැත්තෙකු විසින් භාණ්ඩ හෝ සේවාවල සැපයුම් වේලාව පදනම් කරගෙන එකතු කළ අගය මත බදු අය කිරීම හා ගෙවීම් කළ යුතුය.

(A) පහත සිදුවීම් වලින් කලින්ම සිදුවීම සිදුවන දිනය **භාණ්ඩ** සැපයීමේ වේලාවයි.

- ඉන්වොයිස් පත්‍රය නිකුත් කරන දිනය
- ගෙවීමක් / අත්තිකාරමක් ලබන දිනය
- අනාගත ගෙවීමක් ලැබීමට නියමිත දිනය
- භාණ්ඩ භාරදුන් දිනය

(B) පහත සිදුවීම්වලින් කෙලින්ම සිදුවීම සිදුවන දිනය **සේවා** සම්බන්ධව සැපයීමේ වේලාවයි.

- ඉන්වොයිස් පත්‍රය නිකුත් කරන දිනය
- ගෙවීමක් / අත්තිකාරකමක් ලබන දිනය
- අනාගත ගෙවීමක් ලැබීමට නියමිත දිනය
- සේවාව ඉටු කල / සැපයූ දිනය

**බද්දට යටත් ක්‍රියාකාරකම්**

බද්දට යටත් ක්‍රියාකාරකමක් යන්නෙන් පහත දෑ අදහස් වේ.

(a) වෙළඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් වශයෙන් කරගෙන යනු ලබන ඕනෑම ක්‍රියාකාරකමක් (වෙළඳ හෝ ව්‍යාපාර ස්වභාවය දරන ඕනෑම කටයුත්තක්ද ඇතුලත්ව) **එහෙත් සේවා නියුක්තිය ඇතුලත් නොවේ.**

(b) සමාජ ශාලාවක් සංගමයක් හෝ සංවිධානයක් සම්බන්ධව වන එම ප්‍රතිශ්ඨාවක් හෝ දායක මුදල ගෙවීම සඳහා එහි සාමාජිකයන්ට හෝ අන් අයට පහසුකම් සැලකීමක්.

(c) ඉහත a හා b හි සඳහන් ක්‍රියාකාරකමක් හෝ පහසුකම් සැලසීමක් ආරම්භ කිරීමට හෝ නැවැත් වීමට අදාලව කරන දෙයක්.

(d) යම් චංචල දේපලක් කුලියට හෝ කල් බදු දීමක් හො නිශ්චල දේපලක් කුලියට බද්දට දීමක් හෝ යම් දේපලක් පරිපාලන කිරීමක්.

(e) පේටන්ට් බලපත්‍ර, ප්‍රකාශන අයිතිය වැනි අස්පෘශ්‍ය දේවල් හෝ එවැනි වෙනත් වාර්තාවේ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති හෝ, ඒ වත්කම්වල හිමිකරුවන් ශ්‍රී ලංකාවේ වාසය කරන අස්ථාවක ඒවා ප්‍රයෝජනයට ගැනීමක්.

**ලියාපදිංචි වීමේ ප්‍රතිඵල**

එකතු කල අගය මත බද්ද සඳහා ලියාපදිංචි වූ තැනැත්තෙකු ලියාපදිංචියට ලියාපදිංචියට අදාල සැපයුමේ සීමාවට වඩා අඩු සැපයුමක් ඇති අවස්ථාවක වුවද එකතු කළ අගය මත බදු අයකිරීම කල යුතුය.

ලියාපදිංචිය ලබාගත් දින සිට මාස 12 ක් ඇතුලත ලියාපදිචිය අවලංගු කළ නොහැකිය.

JMCvLearning "your virtual learning partner"

### ලියාපදිංචිය අවලංගු කිරීම

මාස 12 ක කාලසීමාවෙන් අනතුරුව, දේශීය ආදායම් කොමසාරිස්වරයා පහත කරුණු පිළිබඳව සෑහීමකට පත් වාර්තා නම් ඔහුට / ඇයට ලියාපදිංචිය අවලංගු කළ හැකිය.

(අ) ලියාපදිංචි තැනැත්තා විසින් බදු අය කල හැකි ක්‍රියාකාරකම් නතර කිරිම.

(ආ) බද්දට යටත් සැපයුම්වල වටිනාකම ලියාපදිංචි සීමාවට වඩා අඩු වීම.

(ඇ) ලියාදිංචිය පවත්වාගෙන යාම ආදායමේ ආරක්ෂාවට බාධාවක් වීම.

(ඈ) රේගු ආඥා පනතින් පහසුකම් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අත්හිටුවා තිබීම.


### බදු අනුපාතයන් (VAT Ratios)

(a) සම්මත අනුපාතය

- 2019 දෙසැම්බර් 01 දින සිට - 8%

(b) ශූන්‍ය අනුපාතය - 0% (ශ්‍රී ලංකාවෙන් සිටින පාරිභෝජනය කරන භාණ්ඩ හා සේවා)

- භාණ්ඩ අපනයන (මෙහිදී වක්‍ර අපනයනකරුවන් අදහස් නොවේ)
- ජාත්‍යන්තර ප්‍රවාහන හා ඍජුවම සම්බන්ධ සේවා සැපයීම (භාණ්ඩ හා මගී)
- ප්‍රතිඅපනයනය සඳහා ආනයනය කල භාණ්ඩ
- ශ්‍රී ලංකාවෙන් පිටතදී භාවිතා කරන ප්‍රකාශන අයිතියක්, පේටන්ට් අයිතියක්, බලපත්‍රයක්, වෙළඳ ලකුණක් හෝ ඒ හා සමාන බුද්ධිමය දේපල අයිතියක්
- මුළුමනින්ම ශ්‍රී ලංකාවෙන් පිටතදී ප්‍රයෝජනයට ගැනීම සඳහා සංවර්ධනය කල පරිගණක මෘදුකාංග
- ශ්‍රී ලංකාවේ බැංකුවක් හරහා විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් ලැබෙන, ශ්‍රී ලංකාවෙන් පිටතදී පාරිභෝජනය සඳහා සැපයෙන ඕනෑම සේවාවක්.




### සටහන 01 - නිදහස් සැපයුම

(i) <u>සැපයුම් හෝ ආනයන</u>

* සහල් පිටි
* තිරිඟු, තිරිඟු පිටි, පාන්
* අමු තේ දලු ඇතුළු
* ඖෂධ
* පොත් (පත්තර, සඟරා, අභ්‍යාස පොත් හැර)

JMC vLearning "your virtual learning partner"

* පරිගණක
* කෘෂිකාර්මික නිෂ්පාදන
* බලශක්ති සුරකින බල්බ
* බොරතෙල්, භූමිතෙල්, ගෑස්, ඩීසල්
* පෙට්‍රල්, තාර, ගල් අඟුරු
* ලොරි රථ, බස් රථ
* ජංගම දුරකතන
* සූර්යය බල පද්ධති
* අධිතාක්ෂණ උපකරණ
* **බේකරි නිෂ්පාදන**

**(ii) <u>ආනයනය කර හෝ දේශීයව සැපයීම</u>**

* අධ්‍යාපන සේවා
* පොදු මාර්ග ප්‍රවාහන සේවා
* විදුලි බලය
* දේශීයව නිෂ්පාදනය කල පොල්තෙල් සැපයීම
* දේශීයව නිෂ්පාදනය කල පරිගණක මෘදුකාංග
* සෞඛ්‍ය සේවා
* සේවකයන්ට ලබා දෙන ආහාර හා ප්‍රවාහන පහසුකම්
* දේශීය සීනි නිෂ්පාදනය
* නිවාස කුලියට දීම
* දේශීයව නිෂ්පාදන ආභරණ
* තීරු බදු රහිත සාප්පු සංකීර්ණ සැපයුම්

**(iii) <u>පහත අවස්ථාවලදී හැර තොග හා සිල්ලර වෙළඳාම මත බදු අය නොකළ යුතුය.</u>**

(a) ඒවා නිෂ්පාදකයින් විසින්ම භාණ්ඩ සැපයීම
(b) ආනයනකරුවන් විසින් භාණ්ඩ සැපයීම
(c) සපයනු ලබන භාණ්ඩ ලබාගත් ප්‍රභවය පිළිබඳව කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත් කිරීමට අපොහොසත් වන සැපයුම්කරුවෙකුගේ සැපයීම
(d) ටෙන්ඩර් කොන්ත්‍රාත්තු මත කුමන හෝ තැනැත්තෙකු විසින් භාණ්ඩ සැපයීම
(e) ඕනෑම තැනැත්තෙකු ඕනෑම අනුක්‍රමික මාස 03 ක මුළු සැපයුම (ඉහත සැපයුම් හා නිදහස් සැපයුම් ද ඇතුලත්ව) රුපියල් මිලියන 75 කට නොඅඩුනම්.

**සටහන 02 - විශේෂ කැලි බදු ක්‍රමය**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් දේශීය වෙළඳපොලේ විකිණීමට අවසර දී ඇති ප්‍රතිශතය ඇතුලත අපනයනාභිමුඛ නිෂ්පාදකයින් විසින් කරන දේශීය විකුණුම් සඳහා කැලි ගණන මත පදනම්ව විශේෂ අනුපාතයකට එකතු කල අගය මත බද්ද ගෙවිය යුතුය.

2019/11/01 දින සිට පහත පරිදි වේ.

- කාන්තා යට කලිසම්, මේස්, පිරිමි යට කලිසම් සහ බොක්සර් කොට කලිසම් හැර එක් ඇඟලුමක් සඳහා රු. 1.00
- කාන්තා යට කලිසම්, මේස්, පිරිමි යට කලිසම් සහ බොක්සර් කොට කලිසම් කැලි 06 ක් සඳහා රු. 100.

**විශේෂ**

2019.12.01 දින සිට මුළු යෙදවුම් වටිනාකම 60% කට නොඅඩු ප්‍රමාණයක් දේශීය සැපයුම්වලින් / මූලාශ්‍රවලින් සපයා ගන්නේ නම් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇති හෝටල්, ආගන්තුක නිවාස, ආපනශාලා හෝ සමාන සේවා සපයන අනෙකුත් ඒ සමාන ව්‍යාපාර විසින් සපයන සේවා මත ශුන්‍ය අනුප්‍රමාණය අදාල වේ.

## ශුන්‍ය අනුපාත සැපයුම හා නිදහස් සැපයුම අතර වෙනස

ශුන්‍ය අනුපාත සැපයුම බද්දට යටත් සැපයුමක් වන අතර, එවිට සැපයුමට අදාල බදු අනුපාතය ශුන්‍යයකි. එහෙත් සැපයුම බද්දෙන් නිදහස් නම් එම සැපයුම එකතු කල අගය මත බද්දට යටත් සැපයුමක් නොවේ.

ශුන්‍ය අනුපාත සැපයුම හා නිදහස් සැපයුම අතර මූලික වෙනස වන්නේ ශුන්‍ය අනුපාත සැපයුමක් යටතේ නිමවුම් බද්ද (Input VAT) ශුන්‍යය වුවද එම නිමවුම් වෙනුවෙන් යෙදවූ ආනයනික හෝ දේශීයව මිලට ගත් භාණ්ඩ මත හෝ නිමවුම් කිරීමට භාවිතා කල සේවා මත ගෙවූ යෙදවුම් බද්ද සම්පූර්ණයෙන්ම බදු බැර (නිමවුම් බද්දට හිලව් කිරීමට / ආපසු ගෙවීමට) ලෙස ලබා ගැනීමට ඇති අයිතිවාසිකමකි.

අනෙක් අතට නිදහස් සැපයුමක් ඇති තැනැත්තෙකුට තම සැපයුම මත එකතු කල අගය මත බදු අය කල නොහැකි වන අතරට එම නිමවුම වෙනුවෙන් යෙදවූ ගෙවූ යෙදවුම් බදු සඳහා බදු බැර හෝ ආපසු ගෙවීම්ද ලබාගත නොහැකිය.

## නිමැවුම් බද්ද ගණනය කිරීම

බද්දට යටත් සැපයුම් වලින් වටිනාකම මත අදාල අනුපාතය යෙදීමෙන් නිමවුම් බද්ද (output VAT) ගණනය කරනු ලබයි.

**VAT අනුපාතය**

2019/12/01 සිට - 8%

## සැපයුම් වටිනාකම ගණනය කිරීම

| සැපයුම් වර්ගය | සැපයුම් වටිනාකම |
| --- | --- |
| භාණ්ඩ හා සේවා සැපයීම | සැපයුම මුදල් ප්‍රතිශ්ඨාවක් සඳහා නම්, පහත අගයන්ගෙන් වැඩි අගයයි.<br><br>මුළු ප්‍රතිශ්ඨාව - එකතු කළ අගය මත බද්ද හෝ විවෘත වෙළඳපොල වටිනාකම<br><br>සැපයුම මුදල් ප්‍රතිශ්ඨාවක් සඳහා නොවන්නේ නම් හෝ ප්‍රතිශ්ඨාව සම්පූර්ණයෙන් මුදලින් නොවන්නේ නම්, විවෘත වෙළඳපොල වටිනාකම. |
| ජාතිය ගොඩනැගීමේ බද්ද, නිෂ්පාදන බදු වැනි විකුණුම් මත බදු වෙනම අය කරන්නේ නම්, ඒ සියල්ල සැපයුමේ වටිනාකම ලබා ගැනීමේදී එකතු කල යුතුය. | |
| භාණ්ඩ ආනයනය කිරීම | (CIF අගය x 110%) + අධිභාරය සමඟ ගෙවිය යුතු තීරු බදු + සෙස් (cess) + වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද + නිෂ්පාදන බද්ද |

JMC vLearning "your virtual learning partner"

සැපයුම් වටිනාකම ගණනය කිරීමේදී, බදු කාල සීමාව තුලදී අයකල හැකි ක්‍රියාකාරකමකින් පැන නැගුණු බොල් ණය මත වූ බද්ද, ගෙවිය යුතු බද්ද තීරණය කිරීමේදී අඩු කල හා යම් කපා හරින ලද බොල්ණයක් පසු කාලපරිච්ඡේදයකදී ලැබුණි නම්, එම ලැබුණු මුදල හා යම් කපා හරින ලද බොල්ණයක් පසු කාලපරිච්ඡේදයේ බදු අයකල හැකි සැපයුමක් ලෙස සලකා ඒ මත බදු ගෙවිය යුතුය.

## යෙදවුම් බද්ද නිමවුම් බද්දට හිලව් කිරීම

ලියාපදිංචි තැනැත්තෙකු තවත් ලියාපදිංචි තැනැත්තෙකුගෙන් භාණ්ඩ හා සේවා මිලදී ගැනීම මත හා ඔහු විසින් භාවිතා කළ ආනයන මත ගෙවූ එකතු කළ අගය මත බද්ද යෙදවුම් බද්ද නම් වේ.

නිමවුම් බද්දට (Output VAT) එරෙහිව හිලව් කිරීම / අඩු කිරීම සිදු කල හැක.

නමුත් පහත සඳහන් යෙදවුම් බදු, නිමවුම් බද්දට එරෙහිව හිලව් කිරීමට ඉඩ නොදේ.

- බද්දට යටත් නොවන (බදු නිදහස්) ක්‍රියාකාරකමක් හා සම්බන්ධ මිලදී ගැනීම් හා වියදම් මත දැරූ යෙදවුම් බදු
- බදු ඉන්වොයිසියක් මත මාස 12 හෝ රේගු භාණ්ඩ ප්‍රකාශනයක් මත මාස 24 ක් ඇතුලත හිලව්කර ගැනීමට ඉදිරිපත් නොකල යෙදවුම් බදු
- ගමන් බිමන් කටයුතු සඳහා භාවිතා කරනු ලබන, මෝටර් වාහන මත ගෙවූ යෙදවුම් බදු (මෝටර් සයිකල්, බයිසිකල්, සේවායෝජකයෙකු විසින් ඔහුගේ සේවකයන් සංචාරක ගමන් සඳහා භාවිතා කල මෝටර් වාහන හෝ සංචාරක ප්‍රවාහනය සඳහා හෝ භාණ්ඩ ප්‍රවාහනය සඳහා භාවිතා කල මෝටර් හෝ කුලී මෝටර් රථ හෝ නොවන)
- වලංගු බදු ඉන්වොයිසි පත්‍රයක් සනාථ නොකළ යෙදවුම්
- සේවකයින්ට ආහාරපාන දීම මත දැරූ යෙදවුම් බදු හෝ
- මුල් බදු ඉන්වොයිසිය නිකුත් කල දින සිට මාස 06 ක් ඇතුලත් ඉදිරිපත් නොකල හරපත් හා බැරපත් මත ගැලපීම්
- ඍජුවම ව්‍යාපාරය හා සම්බන්ධ නොවන ලෙස දරණ ලද යෙදවුම් බදු

## බැරපත් හෝ හරපත් මගින් බද්ද ගැලපීම

ලියාපදිංචි තැනැත්තෙකු බදු ඉන්වොයිස් පත්‍රයක් නිකුත් කර වෙනත් තැනැත්තෙකුට කරන ලද සැපයුමක් මත අඩුවෙන් හෝ වැඩියෙන් බදු අයකිරීමෙන් වැරදි බද්දක් ගිණුම්ගත කර ඇති විටෙක, එසේ අඩුවෙන් හෝ වැඩියෙන් අය කරන ලද බද්ද ගැලපීම සඳහා බදු බැර පත්‍රයක් හෝ බදු හර පත්‍රයක් නිකුත් කළ හැකිය.

කෙසේවෙතත්, 2007/01/01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මුල් බදු ඉන්වොයිස් පත්‍රයක් මත අඩුවෙන් ඉල්ලා ඇති යෙදවුම් බද්ද සම්බන්ධයෙන් වූ ඉල්ලීම මත බදු ගැලපීම, අදාල මුල් බදු ඉන්වොයිස් පත්‍රය නිකුත් කිරීමෙන් මාස 06 ක් තුල නිකුත් කල බැර/හර පත්‍රවලට පමණක් සීමා කර ඇත.

## මූළු යෙදවුම් බද්ද සඳහා අති සීමාව

2011.01.01 දින සිට යම් කාලපරිච්ඡේදයකදී අඩු කළ හැකි උපරිම යෙදවුම් බද්ද එම කාලපරිච්ඡේදයේ ප්‍රකාශ කාල නිමවුම් බද්දේ උපරිමයට සීමා වේ. නිමවුම් බද්ද ඉක්මා වූ යෙදවුම් බද්දේ අතිරික්ත මුදල ඉන් ඉක්බිතිව එළඹෙන කාල පරිච්ඡේදයට ගෙන ගොස් අඩු කරගත හැකිය.

එහෙත් ශුන්‍ය අනුපාතයට අයත් සැපයුම් මත ඉහත සීමාව අදාල නොවේ.

JMC vLearning your virtual learning partner

### මිශ්‍ර ක්‍රියාකරකම් මත යෙදවුම් බදු අඩු කිරීම

යම් ලියාපදිංචි තැනැත්තෙකුට ලැබෙන භාණ්ඩ හෝ සේවා සැපයුමක් හෝ ඔහු විසින් ආනයනය කරන ලද භාණ්ඩ, ඔහු විසින් කරගෙන යන බදු අය කළ හැකි ක්‍රියාකාරකමකට සහ බදු නිදහස් ක්‍රියාකාරකමකට භාවිතා කරන අවස්ථාවකදී එම භාණ්ඩ හා සේවා මත වන යෙදවුම් බද්ද, බදුවන හා බදු නොවන සැපයුම් වටිනාකමට අනුපාතිකව, බදු නොවන ක්‍රියාකාරකම් මත දරන ලද යෙදවුම් බදු අඩු කිරීමට ඉඩ නොදේ.

## බදු ඉන්වොයිසිය (Tax Invoice)

### බදු ඉන්වොයිසිය නිකුත් කිරීම

වලංගු බදු ඉන්වොයිසියක් **රහිතව** දරන ලද යෙදවුම් බදු, නිමවුම් බදු වලට හිලව් කරගත නොහැකිය. එමනිසා නමේ පිළිබඳව අවබෝධය ඉතා වැදගත් වේ.

එකතු කල අගය මත බදු ඉන්වොයිසියක් නිකුත් කළ හැක්කේ එකතු කල අගය මත ලියාපදිංචි වූ තැනැත්තෙකු විසින් තවත් එකතු කළ අගය සඳහා ලියාපදිංචි වූ තැනැත්තකු පමණි.

බදු ඉන්වොයිසි පත්‍රයක පහත තොරතුරු අන්තර්ගත විය යුතුය.

1. සැපයුම්කරුගේ නම, ලිපිනය, VAT සඳහා ලියාපදිංචි අංකය
2. සැපයුම ලැබූ තැනැත්තාගේ නම, ලිපියනය, ලියාපදිංචි අංකය
3. බදු ඉන්වොයිස් අංකය නිකුත් කල දිනය හා ලියාපදිංචි අංකය
4. සැපයුම සිදුකල දිනය සහ භාණ්ඩ හා සේවා පිළිබඳව විස්තර
5. සැපයුම් ප්‍රමාණය හා ධාරිතාව
6. සැපයුමේ වටිනාකම, අය කල එකතු කල අගය මත බද්ද සහ සැපයුම් සඳහා ප්‍රතිශ්ඨාව
7. ඉන්වොයිස් පත්‍රයේ හොඳින් පෙනෙන ආකාරයට ''බදු ඉන්වොයිසිය / Tax Invoice යන වචනය

බදු අය කල හැකි සැපයුමක් කරන ලියාපදිංචි තැනැත්තෙකු විසින්, එම සැපයුම ලබන්නා විසින් ඒ සැපයුම් වේලාවේ සිට දින 14 ක් ඇතුලත තමා ලියාපදිංචි තැනැත්තෙකු ලෙස සලකනු ලබන බව සඳහන් කර බදු ඉන්වොයිසිය නිකුත් කරන ලෙස ඉල්ලීමක් කර ඇත්නම්, එම සැපයුමේ දින සිට දින 28 ක් ඇතුලත බදු ඉන්වොයිසි පත්‍රයක් නිකුත් කල යුතුය.

කෙසේවුවත් එම තැනැත්තා පළමු සැපයුම ලැබීමෙන් පසු ඉල්ලීමක් කර ඇත්නම් ඉන් පසුව එවැනි ඉල්ලීමක් නැවත කිරීම අවශ්‍ය නොවේ.

### අපනයන මත බදු ඉන්වොයිසි

භාණ්ඩ අපනයයේදී රේගු භාණ්ඩ ප්‍රකාශනය (cusdec) හෝ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා සත්‍යාපණය කරන ලද වෙනත් ලේඛනයක් බදු ඉන්වොයිසිය ලෙස සැලකේ.

### බදු ඉන්වොයිසි පිටපත් රඳවාගැනීමේ වගකීම

සැපයුම ලබන්නාට ඉන්වොයිසි පත්‍රයේ මුල් පිටපත නිකුත් කල යුතු අතර එහි දෙවන පිටපත එය නිකුතු කළ බදු අය කල හැකි කාලසීමාව අවසන්වීමෙන් පසුව, **<u>වසර 05 ක්</u>** ගතවන තෙක් සැපයුම්කරු විසින් ලග තබාගත යුතුය.

### බදු ඉන්වොයිසි පිටපත් නිකුත් කිරීම

එක් සැපයුමක් සඳහා බදු ඉන්වොයිසි පත්‍ර එකකට වඩා නිකුත් කිරීම නීත්‍යානුකූල නොවේ. බදු ඉන්වොයිසි මුල් පිටපත හැකි වූ බව සැපයුම්ලාභියා දැනුම් දී සිටින ''පිටපතක් පමණයි'' යන්න (පැහැදිලිව ලකුණු කල පිටපතක් ඔහු වෙත නිකුත් කළ හැක)

### බදු නොවන ඉන්වොයිසි (වාණිජ ඉන්වොයිසි) නිකුත් කිරීම

ලියාපදිංචි නොවූ තැනැත්තෙකුට, කරනු ලබන සැපයුමකදී එම සැපයුමට අය කල බද්ද ද ඇතුලත් වූ සම්පූර්ණ ප්‍රතිශ්ඨාව සඳහන් කරමින් ඉන්වොයිසි පත්‍රයක් නිකුක් කල යුතුය. එවැනි ඉන්වොයිසි පත්‍රයක් බදු ඉන්වොයිසි පත්‍රයක් ලෙස නොසැලකිය යුතු අතර ''බදු ඉන්වොයිසිය'' යන වචනය එහි සඳහන් නොකළ යුතුය.

### එකතු කළ අගය මත බදු බැඳියාව ගණනය කිරීම

මෙම ගණනය කිරීම ඉතා සරල ලෙස පහත ආකාරයට දැක්විය හැකිය.

| | | | |
|---|---|---|---|
| | නිමවුම් බද්ද (සැපයුම් වටිනාකම x බදු අනුපාතය) | = | xxx |
| (-) | ඉඩදිය හැකි යෙදවුම් බද්ද | = | (xxx) |
| | ගෙවිය යුතු ශේෂය | | xxx |

<u>වාර්තා ගොනු කිරීම</u>

සෑම බද්දට යටත් කාලසීමාවකටම අදාල එකතු කළ අගය මත බදු වාර්තා පසුව එළමෙන මාසයේ අවසාන දිනට පෙර ඉදිරිපත් කල යුතුය.

1. බදුවන කාලසීමා මාසයක් වන අයවලුන් ⟶ මාසිකව
   උදා: මාස බදු වාර්තාව අප්‍රේල් 30 වන දින හෝ එදිනට පෙර ගොනු කළ යුතුය.

2. බදුවන කාලසීමාව මාස තුනක් වන අයවලුන් ⟶ කාර්තු පදනම මත
   උදා: ජනවාරි 1 සිට මාර්තු 31 දක්වා කාර්තුවේ බදු වාර්තාව අප්‍රේල් 30 වන දින හෝ එදිනට පෙර ගොනු කල යුතුය.

බදු වාර්තා ගොනු කිරීම පැහැර හරින අවස්ථාවක රු. 50,000 කට නොවැඩි දණ්ඩනයක් ඔහු / ඇය වෙත පැනවිය හැකිය.

### බදු ගෙවීම

2019.10.01 දින සිට සෑම පුද්ගලයෙකුම, මාසිකව බදු ගෙවීම සිදු කල යුතු අතර, යම් මාසයකට අදාල VAT බද්ද එළඹෙන ඊළඟ මාසයේ 20 වන දින හෝ එදිනට පෙර ගෙවිය යුතුය.
උදා: 2021 ජනවාරි මස VAT ගෙවීම, 2020 පෙබරවාරි 20 වන දින හෝ එදිනට පෙර.

### බදු ගෙවීම පැහැර හැරීම මත දණ්ඩන

යම් බද්දක් නියමිත දිනයේදී ගෙවීම පැහැර හැර ඇති විටෙක පහත පරිදි දණ්ඩන අය කෙරේ.

(a) පැහැර හරින ලද බද්දෙන් 10% සමාන මුදලක් හා
(b) ගෙවීම පැහැර හැරින ලද පළමු මාසයෙන් පසු එළඹෙන සෑම මාසයක් හෝ ඉන් කොටසක් සඳහා පැහැර හැරි බද්දෙන් 2% කට සමාන මුදලක්

JMC Learning "your virtual learning partner"

### අතිරික්ත යෙදවුම් බද්දක් මත පැන නැගුණු ආපසු ගෙවීම

යම් යෙදවුම් බද්දක් නිමවුම් බද්දට වඩා වැඩි වන විට එම බද්ද ආපසු ගෙවන අතර එය ඉදිරි බදු අය කළ හැකි කාලසීමාන්හි නිමවුම් බද්ද සඳහා හිලව් කල හැකි වේ.

### ප්‍රශ්නය

ඇගලුම් නිෂ්පාදනයේ යෙදී සිටින සී/ස හොට් හොට් (පුද්ගලික) සමාගමේ 2020 මාර්තු 31 වන දිනෙන් අවසන් කාර්තුව සඳහා වූ පොත් වලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදී. පහත දක්වෙන සියලු ගණුදෙනුවල අදාල අවස්ථාවලදී එකතු කල අගය මත බදු මුදල් ද ඇතුලත් වේ. (සියලුම අගයන් බදු රහිත අගයන් වේ)

### නිමවුම්

| | |
|---|---|
| බදු ලියාපදිංචි තැනැත්තන්ට කරන ලද සැපයුම් | - 1,437,500 |
| බදු ලියාපදිංචි නොවූ තැනැත්තන්ට කරන ලද සැපයුම් | - 2,362,500 |

### යෙදවුම්

| | |
|---|---|
| ලොරි රථයක් ආනයනය කිරීම | - 3,330,000 |
| සේවක ආහාර මිලදී ගැනීම් | - 224,000 |
| අමුද්‍රව්‍ය මිලදී ගැනීම් (බදු ඉන්වොයිසියක් ඇත) | - 573,500 |
| අමුද්‍රව්‍ය මිලදී ගැනීම් (බදු ඉන්වොයිසියක් නැත) | - 336,000 |
| විදුලිය | - 168,000 |
| සේවක වැටුප් හා වේතන | - 560,000 |

**ඔබ විසින්,**

2021/03/31 ක් අවසන් කාර්තුව සඳහා ගෙවිය යුතු එකතු කල අගය මත බදු මුදල ගණනය කරන්න.

### සරල කළ එකතු කළ අගය මත බදු ක්‍රමය (SVAT)

එකතු කල අගය මත වූ බදු ක්‍රමයේ බදු එකතු කර (ආපසු ගෙවීමේ ගණුදෙනු ප්‍රමාණය අවම කරමින් එම බදු ක්‍රමය වඩාත් සරල කිරීමේ අරමුණින් 2011.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සරල කරන ලද එකතු කල අගය මත බදු ක්‍රමය (simplified VAT system) 2011 අංක 09 දරණ සංශෝධිත පනතින් හඳුන්වාදෙන ලදී.

මෙම ක්‍රමයට අනුව ආපසු ගෙවීම් හිමි පුද්ගලයන්ට ලියාපදිංචි වූ හඳුනාගත් ගැණුම්කරුවන් (RIP) ලෙස ලියාපදිංචි විය හැකි අතර ඔවුන් යෙදවුම් බද්ද (Input VAT) මුදලින් ගෙවීම අවශ්‍ය නොවේ. ඒ වෙනුවට සරල කරන ලද බදු බැර වව්චරයක් අදාල ලියාපදිංචි වූ හඳුනාගත් සැපයුම්කරුවන්ට නිකුත් කිරීම තුලින් අදාල යෙදවුම් බද්ද විලම්භිත කළ හැකිය.

SVAT ක්‍රමය සඳහා ලියාපදිංචි වීමට සුදුසුකම් ලබන තැනැත්තෙක් එනම් ලියාපදිංචි වූ හඳුනාගත් ගැණුම්කරුවන් (RIP) සහ ලියාපදිංචි වූ හඳුනාගත් සැපයුම්කරුවන් (RIS) පිළිබඳව පහත විස්තර කෙරේ.

### ලියාපදිංචි වූ හඳුනාගත් ගැණුම්කරුවන්
**(Registered Identified Purchaser - RIP)**

මේ ගණනයට පහත තැනැත්තන් අයත් වේ.

(i) භාණ්ඩ හා සේවා අපනයනකරුවන් (ශුන්‍ය අනුපාත සැපයුම්කරුවන්)

(ii) එකතු කල අගය මත බදු පනතේ පළමු උපලේඛනයේ දෙවන කොටසේ (f) (i) ඡේදයෙහි සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක යෙදී සිටින ලියාපදිංචි තැනැත්තන්

(iii) පනතේ පළමු උපලේඛනයේ II කොටස (ඊ) වගන්තියේ සඳහන් විශේෂිත ව්‍යාපෘතියක යෙදී සිටින තැනැත්තන්

(iv) නිෂ්පාදනය කර අපනයනය කරනු ලබන භාණ්ඩයක තත්ත්වය (ස්වභාවය හෝ අගය වැඩි දියුණු කිරීම පිණිස යම් සේවාවක් සපයන තැනැත්තන්)

(v) පනතේ 22(7) වගන්තිය යටතේ ලියාපදිංචි වී ඇති තැනැත්තන්

(vi) SVAT ක්‍රමය යටතේ RIP තැනැත්තෙකුට සැපයුම් කරන සැපයුම්කරුවෙකු (ඔහුගේ මුළු සැපයුම්වලින් 50% කට වඩා මෙම වර්ගයේ සැපයුම් වැඩි විය යුතුය)


## ලියාපදිංචි වූ හඳුනාගත් සැපයුම්කරුවන්
**(Registered Identified Suppliers - RIS)**

SVAT ක්‍රමය යටතේ ලියාපදිංචි වූ තැනැත්තන් වෙත භාණ්ඩ හා සේවා සැපයුම් කරන තැනැත්තන් ලියාපදිංචි වූ හඳුනාගත් සැපයුම්කරුවන් (RIS) ලෙස හැඳින්වේ.

RIS විසින් RIP කෙනෙකු වෙත කරන සැපයුම මත ගෙවිය යුතු VAT, SVAT ක්‍රමය යටතේ අත්හිටවනු ලැබේ.

එමෙන්ම RIP විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් බැර වව්චර් ලබාගෙන, ඒ ඒ සැපයුමට අදාල RIS වෙත අත්හිට වූ ඒ අ. බදු ප්‍රමාණය සඳහා නිකුත් කල යුතුය. තවද RIP හා RIS යන දෙදෙනාම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත අදාල ලිපි කටයුතු SVAT ක්‍රමය යටතේ සැපයිය යුතුය.

## මෙම සරල කරන ලද බදු ක්‍රමය ක්‍රියාත්මක වන ආකාරය




- සියළුම ලියාපදිංචි වූ හඳුනාගත් ගැණුම්කරුවන්ට අනුක්‍රමයට අංක කරන ලද සරල කරන ලද බදු බැර වව්චර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ලබාදෙනු ඇත.

- ලියාපදිංචි වූ හඳුනාගත් ගැණුම්කරුවන් ලියාපදිංචි වූ හඳුනාගත් සැපයුම්කවරුන්ගෙන් භාණ්ඩ හා සේවා මිලදී ගන්නා විට, එම සැපයුම්කරුවන් අත්හිටවූ එකතු කල අගය මත බදු ඉන්වොයිසියක් නිකුත් කල යුතුය. මෙම ඉන්වොයිසිය ''බදු ඉන්වොයිසියක්'' (Tax invoice) සලකනු නොලැබේ.

- එලෙසින්ම මිලදී ගැනීමක් සිදු කල ලියාපදිංචි වූ හඳුනාගත් ගැණුම්කරු එම මිලදී ගැනීම සිදු කල මාසයේ ඉක්බිති වූ මාසයේ 14 වන දින හෝ ඊට පෙර එහි සැපයුම්කරුට (RIS) විලම්භනය කරන ලද එකතු කල අගය බැර වව්චරයක් (SVCV) (Suspended VAT credit – voucher) නිකුත් කළ යුතු අතර එහි පිටපතක් තමා වෙත රඳවා ගෙන ඒවා අළුත් බැර වව්චර ලබා ගන්නා විට දේ. ආ. දෙපාර්තමේන්තුවට තමාගේ බදු නිශ්කාෂණ (Tax clearance)

JMC vLearning "your virtual learning partner"

සහතිකයක් සමඟ ඉදිරිපත් කල යුතුය. එලෙස RIP විසින් SCVC ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් එය සාමාන්‍ය සැපයුමක් සේ සලකා බදු අය කල යුතුය.

- මෙම බදු ක්‍රමය යටතේ ලියාපදිංචි වූ හඳුනාගත් ගැණුම්කරුවන් (RIP) බදු මුදල් නෛතිකව නොගෙවන අතර එම අදාල බැර වව්චරය මඟින් අදාල බැර හිමිකම ලබා දේ. එමනිසා බදු අතපසු ගෙවීමක් අදාල නොවේ.

- තවද ගැණුම්කරු විසින් එම භාණ්ඩ හා සේවාවන් අදාල බදුවන කාර්යයට හැර වෙනත් දේකට යොදවා ගනු ලැබුවහොත් එය බදු වන සැපයුමක් ලෙසින් සැලකිය යුතු වේ.

- එකතු කල අගය මත වූ බදු වලින් නිදහස් කර ඇති කිසිම සැපයුමක් මෙම විලම්භනය කරන ලද බදු ක්‍රමය යටතේ සැපයීම කළ නොහැකිය.

## SVAT ක්‍රමය යටතේ බදු වාර්තා ගොනු කිරීම

- සියළුම ලියාපදිංචි වූ හඳුනාගත් ගැණුම්කරුවන් (RIP) මාසික බදු වාර්තා සැපයීම සිදු කල යුතුය.

- තම මුළු සැපයුම් වලින් % කට වැඩියෙන් මෙලෙස බදු විලම්භනය කල සැපයුම් ඇති සැපයුම්කරුවන්ද මාසික බදු වාර්තා සැපයීම කල යුතුය.

- එම බදු වාර්තා වලට අමතරව සියළුම හඳුනාගත් සැපයුම්කරුවන් (RIS) සහ ලියාපදිංචි වූ හඳුනාගත් ගැණුම්කරුවන් (RIP) දේ. ආ. කොමසාරිස් හඳුන්වාදුන් අදාල වාර්තා සහ ලියවිලි අදාල පරිදි සකස් කිරීම නිකුත් කිරීම සහ ලිපිගොනු ගත කිරීම සිදු කල යුතු වේ.

JMC vLearning "your virtual learning partner"

# සංචාරකයින් සම්බන්ධ එකතු කල අගය මත බදු

**සංචාරකයින් සඳහා එකතු කල අගය මත බදු ආපසු ලබාදීමේ ක්‍රමවේදය.**

(Tourist VAT Reform Service – TVRS)

එකතු කල අගය මත සංචාරක බදු ආපසු ලබාදීමේ ක්‍රමවේදය 2018 සැප්තැම්බර් 11 වන දින සිට ශ්‍රී ලංකාවට හඳුන්වාදෙන ලදී.

සංචාරකයෙකු විසින්, "Tax Free" සන්නාමය ප්‍රදර්ශනය කරනු ලබන බලය ලත් සිල්ලර වෙළඳසැල් වලින් එකතු කල අගය මත බදු ගෙවා මිලදී ගත් භාණ්ඩවල වටිනාකම (VAT රහිතව) රු. 50,000 වැඩි වන විට ඔහුට ශ්‍රී ලංකාවෙන් පිටව යන විට එකතු කල අගය මත බද්ද ආපසු ලබා ගැනීමට ඉල්ලුම් කළ හැකිය.

**TVRS යටතේ ආපසු ගෙවීම් ලබා ගැනීමට සුදුසුකම් ලබන සංචාරකයින්**

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු හෝ පදිංචිකරුවෙකු නොවිය යුතුය.
2. ආගමික හා විගමන පාලකවරයා විසින් නිකුත් කරනු ලැබූ සංචාරක වීසා මත දින 90 කට වඩා අඩු කාලයක් ශ්‍රී ලංකාවේ නැවතී සිටිය යුතුය.
3. ශ්‍රී ලංකාවට පළමු වරට පැමිණෙන විට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතුය.

**එකතු කල අගය මත සංචාරක බදු ආපසු ලබාදීමේ ක්‍රමවේදයන්ට කොන්දේසි**

1. සංචාරකයෙකු විසින් අවම වශයෙන් රු. 50,000 ක් (VAT රහිතව) වටිනා එකතු කල අගයට යටත් භාණ්ඩ අනුමත කල සිල්ලර වෙළෙන්දෙකුගෙන් මිලදී ගෙන තිබිය යුතුය.
   a. එක් බලයලත් සිල්ලර වෙළඳසැලකින් දිනකට උපරිම වාණිජ ඉන්වොයිසි තුනකට (03) නොවැඩි විය යුතුය සහ
   b. එම වාණිජ ඉන්වොයිසි සහ ගමන් බලපත්‍ර ඉදිරිපත් කිරීමෙන් එම බලයලත් සිල්ලර වෙළඳසැලින් VAT ආපසු ලබාදීමේ ඉන්වොයිසි (TVRI) ලබාගත යුතුය.
2. සංචාරකයින් විසින් TVRS අයදුම්පත්‍රයක් මගින් ආපසු ගෙවීම ඉල්ලා සිටිය යුතුය.
3. භාණ්ඩ ගමන් මල්ලක හෝ අන් බෑගයක ශ්‍රී ලංකාවෙන් ගෙන යා යුතුය.

(ඉහත ඉන්වොයිසිවල දක්වන ලද භාණ්ඩ රේගුවේදී භෞතික පරීක්ෂාව සඳහා පැවතිය යුතුය)

**සංචාරක බදු ආපසු ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබන භාණ්ඩ**

පහත සඳහන් භාණ්ඩ හැර අනෙකුත් VAT ගෙවා මිලදී ගන්නා ලද භාණ්ඩ බදු ආපසු ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

1. ආරක්ෂක හේතුමත ගුවන්යානාවල ගෙනයාම තහනම් භාණ්ඩ
2. ශ්‍රී ලංකා රේගු ආඥා පනතේ තහනම් හා සීමා කරන ලද භාණ්ඩ
3. VAT නිදහස් භාණ්ඩ
4. සම්පූර්ණයෙන් හෝ අඩු වශයෙන් ශ්‍රී ලංකාවේදී පාරිභෝජනය කල ඕනෑම භාණ්ඩයක්
5. පරිභෝජනය කල සේවා (හෝටල් ගාස්තු)
6. අන්තර්ජාලයෙන් මිලදී ගෙන ශ්‍රී ලංකාවෙන් පිටතට ගෙනයන භාණ්ඩ
7. අයදුම්පත්‍රය සමඟ කවුන්ටරය වෙත පරීක්ෂාව සඳහා ඉදිරිපත් නොකරන භාණ්ඩ

JMC vLearning "your virtual learning partner"

**බදු ආපසු ලබා දීම සිදු කරන්නේ කොහිදී ද?**

❖ රටින් පිටවන අවස්ථාවේදී කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ TVRS කවුන්ටරයෙන්.

## ගෙවීම් සිදු කරන ක්‍රියාවලිය

<u>පියවර 01</u>

සුදුසුකම් ලබන භාණ්ඩ පහත ලියවිලි සමඟ රේගු සත්‍යාපන කවුන්ටරය වෙත ඉදිරිපත් කළ යුතුය.

- සම්පූර්ණ කළ අයදුම් පත්‍රය
- VAT ආපසු ලබාදීමේ ඉන්වොයිසිය (TVRI) මුල් පිටපත්
- වලංගු ගමන් බලපත්‍රය

<u>පියවර 02</u>

රේගු පරීක්ෂාවෙන් පසු, ඉහත ලියවිලි දේශීය ආදායම් TVRS කවුන්ටරය වෙත ඉදිරිපත් කල යුතුය.

<u>පියවර 03</u>

ගෙවීම් වව්චරය පිටවීම පර්යන්තයේ ඇති ලංකා බැංකු ශාඛාවට ඉදිරිපත් කල විට සංචාරක බදු නැවත මුදලින් ලබා දේ.

## ව්‍යාපාරයක එකතු කළ අගය බදු කළමනාකරණය කිරීම

බදු ගෙවන්නන් විසින් සපයන ඇති බදු වාර්තා මත තක්සේරු නිකුත් කිරීමට, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරුන්ට බලය පැවරී ඇත.

## කාල කඩඉම (Time Line)

එකතු කල අගය බදු සඳහා ලියාපදිංචි තැනැත්තකු නියමිත දිනට පෙර VAT බදු වාර්තාව සපයා ඇත්නම්, බදු කාලය අවසන් වී වසර තුනක් ගතවීමට පෙර, තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කිරීමට සහකාර කොමසාරිස්ට බලය ඇත.

උදා: 2020 මාර්තු 31 න් අවසන් බදු කාල සීමාව සඳහා වාර්තාව 2020 අප්‍රේල් 30 දිනට හෝ එදිනට පෙර සැපයිය යුතුය.

බදු ගෙවන්නා 2020 අප්‍රේල් 30 වන දින හෝ එදිනට පෙර වාර්තාව සපයා ඇත්නම්, සහකාර කොමසාරිස් විසින් තක්සේරුවක් නගන්නේ නම් එය 2023 අප්‍රේල් 30 පෙර නිකුත් කළ යුතුය.

## කාල කඩඉම බල නොපානා ආකාරය

පහත සඳහන් අවස්ථාවලදී වර්ෂ 03 ක් වූ කාල කඩඉම බලපාන්නේ නැත.

- බදු ගෙවන්නා බදු වාර්තාව සපයා නොමැති විට
- VAT පනතේ සඳහන් නියමිත දිනට පසු වාර්තාව සපයා ඇත්නම්
- චේතනාත්මකව හෝ වංචනික කටයුතු හා සම්බන්ධ වී ඇති බවට සහකාර කොමසාරිස්ගේ මතය වන විට

JMC Learning "your virtual learning partner"

**තක්සේරුව (Assessment)**

පහත සඳහන් අවස්ථාවලදී තක්සේරු නැගිය හැකිය.

- කිසියම් ලියාපදිංචි තැනැත්තෙකු කිසියම් බදු කාලයකට අදාල වාර්තාව සැපයීමට අපොහොසත් ඇති විට
- ලියාපදිංචි තැනැත්තෙකු බදු වාර්තාව නිසි දිනට පෙර සපයා ඇති නමුත් බද්ද ගෙවීමට අපොහොසත්ව ඇති විට
- බදු ගෙවන්නා තම සැපයූ වාර්තාවට එකතු කිරීමක් හෝ වෙනස් කිරීමක් කරන ලෙස ඉල්ලා ඇති විට
- කිසියම් බදු කාලයක් සඳහා බදු ගෙවන්නා විසින් ගෙවන ලද බද්ද ගෙවිය යුතුව තිබූ බද්දට වඩා අඩුයැයි සහකාර කොමසාරිස් මතය වන විට

**අභියාචනා විසඳීමේ ක්‍රියාපටිපාටිය**

තක්සේරු ලැබී දින 30 ක් ඇතුලත පහත පිළිවෙලට අභියාචනා ඉදිරිපත් කල යුතුය.

1. සහකාර කොමසාරිස් ඉදිරියේ අභියාචනය
2. කොමසාරිස් ජනරාල් ඉදිරියේ අභියාචනය
3. අභියාචනා කොමිසමට අභියාචනය කිරීම
4. නීති ගැටලුවක් මත අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් වන අභියාචනා

JMC vLearning "your virtual learning partner"

# B. මූල්‍ය සේවා මත එකතු කළ අගය මත වූ බද්ද (පනතේ 25 අ 25 ඒ වගන්තිය)

### හැඳින්වීම (මූල්‍ය සේවා මත එකතු කළ අගය මත වූ බද්ද)

මූල්‍ය සේවා මත එකතු කළ අගය මත වූ බදු සඳහා වන ප්‍රධාන ප්‍රතිපාදන පහත පරිදි විස්තර කෙරේ.

### බදු බැඳියාව

එකතු කළ අගය මත බදු පනතට 2003 අංක 7 දරණ සංශෝධන පනත මගින් III (අ) පරිච්ඡේදය ඇතුළත් කිරීමෙන් 2003 ජනවාරි 01 වන දින සිට මූල්‍ය සැපයුම ද මෙම බද්දට යටත් කරන ලදී. (25 (අ) වගන්තිය).

### බද්දට යටත්වන තැනැත්තන්

පනත නියමයන් සපුරන තැනැත්තන් එකතු කළ අගය මත බදු ගෙවීමට බැඳේ.

(i) 2003.06.30 දක්වා මෙය අදාළ වූයේ ''නිශ්චිත ආයතන'' සඳහා පමණි. මෙහිදී ''නිශ්චිත ආයතන'' යනුවෙන් අදහස් කරන්නේ,

(අ) 1988 අංක 30 දරණ බැංකු පනතට ගැනෙන බලපත්‍රලාභී වාණිජ බැංකුවක්

(ආ) 1988 අංක 78 දරණ මූල්‍ය සමාගම් පනත යටතේ ලියාපදිංචි වූ මූල්‍ය සමාගමක්

(ඇ) 1988 අංක 30 දරණ බැංකු පනත යටතට ගැනෙන බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්

කෙසේවුවත්, 2003 ජුලි 01 වන දින සිට වලංගුවන පරිදි සමුපකාර සමිති ද, 2003 07.01 දින සිට වලංගු වන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව ද 2009.01.01 සිට ලේඩි ලෝහර් ණය අරමුදල ද මූල්‍ය සේවා සැපයීමේ ව්‍යාපාරයන්ගෙන් ඉවත් කරන ලදී. (පනතේ 57 (අ) (i), (iii) සහ (iv) වගන්ති)

තවද ඒකක භාරයක් හෝ අන්‍යෝන්‍ය අරමුදලක් විසින් මූල්‍ය සේවා සැපයීම බද්දට යටත් මූල්‍ය සේවාවන්ගෙන් ඉවත් කර තිබේ.

(ii) ''මූල්‍ය සේවා'' සපයන තැනැත්තන් සඳහා මෙම පරිච්ඡේදය අදාළ වන අතර මූල්‍ය සේවා යන්න මෙම පරිච්ඡේදයේ නිර්වචනය කර තිබේ. පහත 1.6.1.2 ඡේදයේ එසේ නිර්වචනය කර ඇති මූල්‍ය සේවාවන් දක්වා ඇත. (පනතේ 25 ඒ අනුව)

(iii) මෙම පරිච්ඡේදය යටතේ ඉහත (ii) හි සඳහන් මූල්‍ය සේවා සපයන සෑම පුද්ගලයෙකුම බද්දට යටත් වේ.

(iv) බද්දට යටත් වීම පිණිස මූල්‍ය සේවා සැපයුමේ වටිනාකම කාර්තුවකට රුපියල් 75,000,000 ක් හෝ වර්ෂයකට රු. 300,000,000 ක් ඉක්මවිය යුතුය.

## බද්දට යටත් මූල්‍ය සේවාවන්

මූල්‍ය සේවා යන්නට පහත සැපයුම ඇතුළත් වේ. (25 ඊ වගන්තිය ප්‍රකාරව)

(අ) යම් ජංගම, තැන්පතු හෝ ඉතිරිකිරීමේ ගිණුමක් ක්‍රියාත්මක කිරීම.

(ආ) ව්‍යපහාර මුදල් හුවමාරු කිරීම.

(ඇ) යම් නෝට්ටුවක්, ගෙවීම් නියෝගයක්, චෙක්පතක් හෝ ණයවර ලිපියක් නිකුත් කිරීම, ඒ සඳහා ගෙවීම, එකතු කිරීම හෝ ඒවායේ අයිතිය පැවරීම.

(ඈ) යම් වාණිජ බැංකුවක් ප්‍රතිව්‍යුහගත කිරීමේ දී යම් තැනැත්තෙකුට එහි අක්‍රීය ණය පැවරීම හැර යම් තැනැත්තෙකු විසින් ණය වී ඇති මුදල ගෙවීමට ඇති යම් අයිතිවාසිකමක් හෝ යම් හිමිකමක් ඇත්තා වූ යම් ණය සුරැකුම්පත් නිකුත් කිරීම, වෙන්කිරීම්, අයිතිය, පැවරීම, අණ කිරීම, ප්‍රතිග්‍රහනය හෝ පිටසන් කිරීම.

(ඉ) යම් සම කොටස් සුරැකුම්පත් හෝ සහභාගී සුරැකුම්පත් නිකුත් කිරීම, වෙන්කිරීම හෝ අයිතිය පැවරීම.

(ඊ) යම් සම කොටස් සුරැකුම්පත්, ණය සුරැකුම්පත් හෝ සහභාගී සුරැකුම්පත් නිකුත් කිරීම, ප්‍රාරක්ෂණය කිරීම හෝ උප ප්‍රාරක්ෂණය කිරීම හෝ ඊට දායක වීම.

(උ) යම් ණය මුදලක්, අත්තිකාරමක් හෝ බැරපතක් සැපයීම.

(ඌ) භාණ්ඩ සැපයුම් ලාභීයාට දැනුම් දුන්නා වූ ද, වෙනම වැය බරක් කරනු ලැබුවා වූද, පහසුකමක් වන කුලී සිනක්කර කොන්දේසි සහිත විකිණීමේදී හෝ ණය විකුණුම් ගිවිසුමකදී,

(i) ණය මූල්‍යකරණ පහසුකම් සැපයීම

(ii) සපයන ලද භාණ්ඩ, ඒ ගිවිසුමේ දිනය වන වටෙ මාස 12 කට නොඅඩු කාලයක් ශ්‍රී ලංකාවේ පාවිච්චි කර තිබෙන විට යම් කුලී සින්නකර ගිවිසුමක් හෝ කොන්දේසි සහිත විකිණීමේ ගිවිසුමක් යටතේ එම භාණ්ඩ සැපයීම.

ජීවිත රක්‍ෂණ, අග්‍රහාර රක්ෂණ සහ එළදා සහ සත්ව (Livestock) රක්‍ෂණ.

කෙසේවෙතත්, 2012 අංක 7 දරණ සංශෝධිත පනත අනුව, 2012.01.01 සිට ඒකක භාරයක් හෝ අනෝන්‍ය අරමුදලක් විසින් මූල්‍ය සේවා සැපයීම මෙම වගන්තියේ කාර්යයක් සඳහා මූල්‍ය සේවාවන් වශයෙන් නොසැලකිය යුතුය.

සංචාරකයා විසින් අයදුම්පත්‍රයක් මගින් ආපසු ගෙවීම ඉල්ලා සිටිය යුතුය. භාණ්ඩ ගමන් මල්ලක හෝ අත් බෑගයක ශ්‍රී ලංකාවෙන් ගෙන යා යුතුය. ඉහත ඉන්වොයිසිවල දක්වන ලද භාණ්ඩ රේගුවේදී භෞතික පරීක්ෂාව සඳහා පැවතිය යුතුය.

JMC vLearning "your virtual learning partner"

**මූල්‍ය ආයතන විසින් එකතු කල අගය මත බදු වාර්තා ගොනු කිරීම**

සෑම ලියාපදිංචි නිශ්චිත ආයතනයක් හෝ වෙනත් තැනැත්තක් විසින් බදු අය කල හැකි කාල සීමාව අවසානයේ ඊට පසුව එළඹෙන මාසයේ අවසාන දිනට පෙර වාර්තාවක් සැපයීම කල යුතු වේ.

2017.01.01 දින සිට, මාස 12 ක කාල සීමාවක් බදු අයකල හකි කාලසීමාව වේ.

- මෙම පරිච්ඡේදය යටතේ ඉහත (ii) හි සඳහන් මූල්‍ය සේවා සපයන සෑම පුද්ගලයකුම බද්දට යටත් වේ.

JMC vLearning "your virtual learning partner"